# වෘක යාලුවෝ



අමාෂා රුවින්දි කුමාරගේ
කතා

# වකා යාලුවෝ

අමාෂා රුවින්දි කුමාරගේ
කතා

පළමු වෙලුම

ISBN No :9786242111339.

7 ශ්‍රේණිය E
මහා/මහාමායා බාලිකා විදුහල
2026.03.05

# පිදුම

ආදරණීය
ගුරුතුමියට සහ
ආදරණීය අම්මාට
අප්පච්චිට.......!



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය



CamScanner

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10


වෘක යාලුවෝ

ඒක රාත්‍රියක අහසේ සඳ පායලා තිබුණේය සඳ එකපාරටම මිල්ෆට් කියන ලොකු නගරයට වැටිලා දෙකට කැඩිනි ඒ කොටස් දෙකට නගරයේ මිනිස්සු නම් දෙකක් දැම්මා සඳගල හා දෛවය ගල කියලා ඒකට හේතුව වන්නේ ඒ නගරයේ මිනිස්සුන්ගේ අතේ තිබ්බා වලල්ලක් ඒ වළලු වලට කියන්නේ සඳ පළඳනා කියල ඔය සඳ පළඳලාවල පාට  නිල් සහ අළු ඒ නිල්පාට බොත්තම එබුවාම ඒ මිනිස්සු වෘකයෝ සහ බල්ලෝ බවට පත්වෙනවා. ඒ නගරයේ හිටියා තාත්තලා දෙන්නෙක් ෆ්‍රෙචර් ලූබන් සහ හාල්ටිස්  බේවුඩ්ස් කියලා මේ දෙන්නගේ පුතාලා දෙන්නා තමයි ෆ්‍රෙඩි ලූබන් හා අයිවන් බේවුඩ්ස්  කියලා තාත්තලයි පුතාලයි හතර දෙනාම වෘකයෝ සහ බල්ලෝ මේ ගල් දෙකෙන්" තමා මේ හැම වෘකයෝ හා බල්ලො හැදිලා තියෙන්නේ. මේ තාත්තලා දෙන්නා ඉගෙනගෙන තියෙන්නේ හවුලින්ටන්ඩ් කියන පාසලේ ෆ්‍රෙඩීට හිටියා යාළුවෝ හයදෙනෙක් මේ යාළුවෝ හය දෙනා තමයි කේට් ඇගී ඕමාන්ඩ් වින්ස් එකට ලෝ කරන්න බැටී හා වෙන්ඩි. ඒ හය දෙනාගෙන් පස්දෙනෙක් වෘකයෝ හැබැයි බැටී  විතරක් බල්ලෙක් බැටිගේ අම්මට එයාගේ දුව වගේ මිනිස් රූපයට එන්න බෑ.



එක දවසක් ඒගොල්ලොන්ගේ අයිතිකාරයා බැටීව බලු රැකවස්ථානයකට දැම්මා. අයිතිකාරයාට ඕන වුණේ බැටිගේ අම්මාව සංදර්ශන බල්ලෙක් කරන්න එයා හිතුවේ බැට්ට ඒවා කරන්න බෑ කියලා අම්මගේ නම ඩජ්ස් ඊට පස්සේ බැටිවයි අම්මාවයි වෙන් කළා. එදාවෙන් පස්සේ බැටියට අම්මා කෙනෙක් නැති උනා එදා ඉඳන් බැටීට  නම දැම්මේ බැටීඩජස්  කියලා මේ හැම බල්ලෙක්ටමයි වෘකයෙක්ටමයි හිරු එළිය ඕනේ ආපසු මිනිස් රූපයට පත්වෙන්න. අයිවන් සාමාන්‍යයෙන් ගත්තොත් ලොකුම ලොකු පිස්සෙක් මේ යාලුවෝ හය දෙනාගෙන් සැරම. හැමවෙලේම තරහ යන උල්දත් දෙකක් තියෙන්නේ කේකට්ටයි. එයා නිල්පාට වෘකයෙක් වගේම ලස්සන කොන්ඩේකුත් තියෙනවා ඇගීව ගත්තොත් විද්‍යාව ගැන මොළේ යොදවලා වැඩ කරන්න දක්ෂයා මේ රංචුවේම දක්ෂම ඥාණවන්ත වෘකයා ෆ්‍රෙඩිගේ යාලුවා බැටී.






හැම දේකටම ළඟින් ඉන්න බල්ලා ඒ තමයි බැටී මේ දෙන්නා යාළුවෙන්න හේතුව ෆ්‍රෙඩී බැටි දෙන්නාම මේ රංචුවෙන් ඉන්න බල්ලෝ දෙන්නා වූ නිසා ෆෙඩ්ගේ තාත්තා ඒ කියන්නේ ෆ්‍රෙවර් එයාගේ සහෝදරයා තමයි හොස්ප්ට් බුල් මෙතුමා තමා මිල්ෆර්ඩ් නගරයේ නගරාධිපතිතුමා එතුමාගේ ළමයි දෙන්නා තමයි හැරියට් චැරියට්  ෆ්‍රෙඩ්ට මිනිස් යාළුවෙක් හිටියා ස්කාලට් කියලා ස්කාලට් ආච්චිගේ නම රෝස් රෝස් කියන්නේ වයසක මෑක වෑක දඩයක්කාරියක් ෆ්‍රෙඩ්ගේ  තාත්තා මුර සංචාරකයෙක් ඒ කිව්වේ මෑක

වෘකයෝ අල්ලන සාමාන්‍ය වෘකයෝ ස්කාලට්ගේ ආච්චි ළඟ දෛවය ගල තිබ්බේ  දඩයක්කාර ජෙනරාල් දෛවය ගල් රෝස්ගෙන් හොරකම් කළා.

මේ ජෙනරාල් ජීවත් වුණේ දඩයක්කරුවන්ගේ මූලස්ථානයක ස්කාලට්ගේ අම්මයි තාත්තයි කලින් මෘකවෘක දඩයක්කාරයෝ ඒ දෙන්නගේ නම් දෙක තමා රෙඩ් ජැගර් සහ රූබි මේ වෘක දඩයක්කාර ජෙනරාල්ගේ නම තමයි සුවිස්  මේ රංචුව ඉගෙන ගන්නේ එයාලාගේ එකම පාසලෙන් ඊට පස්සේ මාස දෙකකට පස්සේ මේ රංචුව වෙන පාසලකට දැම්මා. ඒ තමා ෆ්‍රෙඩිගේ තාත්තයි අයිවන්ගේ තාත්තයි ඉගෙන ගත්ත පාසල හවුලින්ටන් මේ  තමයි නගරේ තියෙන ජනප්‍රියම පාසල හවුලින්ටන්  වලට ආපු පළවෙනි ළමයා තමයි ඕමාන් දෙවැනි ළමයා තමයි ෆ්‍රෙඩී සහ බැටි බැටීට තාම සඳ පළදනාව නැති නිසා එයා බල්ලෙක් සඳ පළදනාව ලැබුණාම එයා මිනිස් රූපයට හැරුණා.

බැටී  පොත් බෑග් එකේ ඉස්කෝලෙට අරගෙන ආවා තුන්වෙනියට ආවේ කේට් හතරවෙනි ළමයි තුන්දෙනෙක් ආවා. ඒ තමයි අපි හැමවෙලේම කියන අයිවනුයි වෙන්ඩී වින්ස්ලොයි හවුලින්ටන්" පාසලේ විදුහල්පතිතුමිය තමා පින්කස් කෙටියෙන් කිව්වොත් පින්කි හවුල්ටන් පාසලේ විදුහල්පතිතුමාගේ උදව්වට ඉන්න එක්කෙනා තමා මිස් ෆියොගි තව උදව්වට ඉන්නේ පිරිමි එක්කෙනා තමයි ගමෝර්. ගමෝර්   මහත්තයා ෆ්‍රෙඩිගේ රංචුවට ඉගැන්වෙන විෂය විද්‍යාව.  ඒ වගේම උගුල් අටවන්නේ කොහොමද කියලත් උගන්වලා දුන්නා. බැටී කියන්නේ පාරේ අම්මා සමග හැදී වැඩුණු බල්ලෙක්. ඒ නිසා දැන් එයාට අම්මත් නෑ නිවසකුත් නෑ, එයාට යාලුවෝ  කියලා ඉන්නේ ෆ්‍රෙඩි, ඇගී,කේට්  ඕමාන් විතරයි.

බැටීට ගෙදර වගේ තියෙන්නෙ හවුලින්ටන් පාසලේ නේවාසිකාගාරය එහි කාමර විස්සක් පමණ ඇත පාඩම් කිරීමට කාමර හතරක් ඇත ෆ්‍රෙඩී ගේ ගෙදර තිබ්බා අක්ෂර සංඥා බිත්තියක් ඒ බිත්තියේ තියෙන අක්ෂර සංඥාවක් එබුවාම ඒ ඔබපු එක්කෙනාට පිටිපස්සේ කවුරු හරි හිටියොත් එයා ඉන්න තැන හිස් වෙලා ගුහාවක් අස්සට ලිස්සලා වැටෙනවා. බැටි අක්ෂර සංඥා විශේෂයෙන් ඉගෙන ගත්ත කෙනෙක් අනිවාර්යෙන් කතා කරන්නේ බැටීට. අක්ෂර සංඥා විභාගයක ලකුණු ඔක්කොම මුළු ලකුණු ගන්න හොඳම පුංචි හුරුබුහුටි ළමයෙක්. හැබැයි බලු රූපයට ආවම එයා හරි සැරයි. ඒ වගේම චූටි බල්ලෙක්. ෆ්‍රෙඩිගේ තාත්තා වෘක කඳවුරේ ඒ කිව්වේ රංචුවේ ලොකුම නායකයා. ෆ්‍රෙඩීගේ යාළුවො වෘකයෝ බල්ලො උනාට මේ අය සත්ව රූපයට ආවම ඇඳුම් අඳින්නේ නෑ.



ෆ්‍රෙඩීගේ  තාත්තාගේ කඳවුරේ විශ්‍රාම ගත් වෘකයෝ දෙන්නෙක්  හිටියා ෆ්‍රෙඩීගේ  ටෝරාගේ මූණු දෙකම එකම විදිහේ ටෝරා ගෑණු ළමයෙක් උනාට දෙන්නම එකම විදිහ ගෑනු පිරිමි  හේතුව තමයි ටෝරාට ගොඩක් දිග නැති තැඹිලි පාට කොන්ඩයක්  තියෙන්නේ  මේ නගරයේම ඉන්න එකම Poodle බල්ලා ෆ්‍රෙඩි ස්නේබර්ඩ්  කියන සීතල නගරයේ ඉන්න එකම  Poodle බල්ලා ටෝරා ෆ්‍රෙඩීලාගේ මුළු පරම්පරාවටම කියන එකම වාසගම ලූබන් අයිවර්ලාගේ පරම්පරාවේ වාසගම  බ්වුඩිස් රංචුවේ ඉන්න නායකයා. කියලා හිතාගෙන ඉන්නේ කියලා වෘක දඩයක්කාරයෝ venjen හරිම මොඩයි ඒ වගේම කොටයි තමන්ගේ යාළුවොත් ගැන හැමවෙලේම හිතනවා  යාලුවා එක්ක  හැමවෙලේම ඉන්නවා.






මේ හවුලින්ටන් වලට රික් කියන එක්කෙනා අනාගතයේ හවුලින්ටන් පාසලේ අනාගත විදුහල්පතිතුමා වෙන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා රික්ට කෙටියෙන් කියන්නේ රිකි කියලා එයාට ඕනේ සඳගලයි දෛව ගලයි අරගෙන ගල් දෙක එකතු කරලා සඳ හදලා ලොකු බලයක් ලබාගන්න හැබැයි රංචුව ඒකට ඉඩ දුන්නේ නෑ. කොහොම හරි සඳගල ආරක්ෂා කරගෙන හිටියේ මේ වනතුරු තාම දෛව ගල කියලා එකක් මේ රංචුව දන්නේ නෑ.

ලඟදී කොහොම හරි රික් සඳගල ගත්තා. මුඛ වෘකයන්ගේ ඇස් රතු හා කළු' මේ ළමා වෘක රංචුවෙන් ෆ්‍රෙඩීටයි ස්කාලට්ඇර අනිත් හැමෝටම රික් අතේ තියෙන මුඛ වෘක පළඳනාවෙන් දුමක් පිට කරලා ඒදුම අර ළමයින්ගේ ඇස් වලට ගිහිල්ලා ඇස් රතු පාට වෙලා මෘක වෘකයෝ වුණා.

රික්ට ඕන ෆ්‍රෙඩීව කොහොම හරි මරන්න හැබැයි බැටි හැම වෙලේම ෆ්‍රෙඩී එක්ක ඉන්නේ එයාව මරන්න ඉඩ දෙන්නේ නෑ.ස්කාලට් සාමාන්‍ය ගෑණු

ළමයෙක් වුනාට මේ වෘක රංචුවේ ඉන්නේ කොහොමද කියලා දන්නවා මේ හවුල්ටන්න් පාසලේ සොහොනක් ඒකෙ නම තමයි මුඛ වෘක සොහොන අන්න ඒකේ තමයි මෘක වෘක නායකයාගේ මිනිය වළලලා තියෙන්නේ. නායකයාගේ පිළිමයට හැමෝම ආචාර කරනවා මායාකාරියක් ඉන්නවා Hath කියලා එයාගේ දුවත් අනාගතයේදී මායාකාරියක් වෙන්න හිතාගෙන ඉන්නේ. දුව මැජික් ඉගෙන ගත්තාම තමන්ගේ අම්මව ගෝවා ගෙඩියක් කරලා Hath කියන නම දාගත්තා.



රික් එයාට තිබ්බේ සාමාන්‍ය වෘකයන් ළඟ තියෙන සඳ පළුඳනාව වගේ නෙවෙයි හරි ලොකු රතුපාට සහ කළු පාට පලදනාවක් ඒකෙ දැක්කහම නම් මටත් බය හිතෙනවා. රතු පාට ලොකු තිතක් තියෙනවා අනික් හැමතැනම කළු පාට තිත් තියෙනවා රත්තරන් පාටින් තිත් දහයක් තියනවා ඒ දහයටම එකට ඔබපුවාම තමා වෘකයන්ගේ ඇස් රතු පාට වෙන්නේ. ඒ රතු පාට වෙන එක නවත්තන්නත් කරන්න ඕන දම් පාට මල් වර්ගයක් තියෙනවා. ඒ මල්වල සැර අර වෘකයන්ගේ ඇස් වලට ගියාම තිබ්බ තත්ත්වයට හැරෙනවා ඒ ඇස් ඊට පස්සේ තිබුණු තත්ත්වයටම ආවා. හැබැයි අයිවන්ගේ රික්ගේ ඇස් ඒ පාටමයි අර මල්වල සැර පැතිරෙන්න කලින් මේ දෙන්නා ඒ මල් වලින් බේරුනා මේ දෙන්නා හොයාගෙන ගියේ ෆ්‍රෙඩීව , අයිවන් ෆ්‍රෙඩී බැටී දෙන්නම දැක්කා මේ දෙන්නා දන්නවා අපි දැක්කා කියලා ඒ බව දැනත්තා ස්කාලට් පැත්තකට වෙලා ලෑස්ති වෙලා හිටියේ රික්ට රිදී ඊතලයක් විදින්න ගිහිල්ලා රික් උඩ පැනලා බැටී අල්ලා ගන්න යනකොට ස්කාලට් ඊතලය විද්දා උඩ පනිනකොට අයිවන් උඩ පැනලා රික්ව පහතට කරද්දී ඒ ඊතලය අයිවන්ගේ ඇගේ වැදීගෙන ගියා.



පහුවදා උදේ අයිවන් ඇගේ  වේදනාවෙන් හිටියේ එදා ප්‍රින්සිපල් මැඩම් අක්ෂර සංඥා විභාගයේ ලකුණු දුන්නා ඒ විභාගයෙන් මුළු ලකුණු ගත් ළමයා තමයි  බැටි ඒ විභාගය F ලකුණ හම්බුනේ ෆ්‍රෙඩීට  ෆ්‍රෙඩීගේ තාත්තා ප්‍රින්සිපල් මැඩම් ගිහින් හම්බ වුනා ෆ්‍රෙඩී කරන දඟ වැඩ ඔක්කොම බිචච්දච එකෙන් තාත්තාට පෙන්නුවා එකේ තිබ්බේ ෆියාගි මිස් මල් පැළ වලට වතුර දදා ඉද්දි ෆ්‍රෙඩී  බලු රූපයට හැරිලා වතුර එක්ක සෙල්ලම් කර කර ඉන්නවා මැඩම් කිව්වා ෆ්‍රෙඩී හොඳ ළමයෙක් නමුත් එයාට අවධානය නෑ කියලා.ඒක ඇහුව තාත්තා ගොඩක් දුක් වුණා.

ඊට පස්සේ මැඩම් පැරණි අක්ෂර සංඥා ප්‍රශ්න පත්තරයක් දුන්නා අද හවස වෙන්න කලින් මේ ප්‍රශ්න පත්තරේ කරලා මට දෙන්න ඕන් නැත්නම් අද හවස තියෙන Concert එකට යන්න බැරි වෙයි කියලා ප්‍රින්සිපල් මැඩම් කිව්වා හැබැයි අයිවන්ට විභාගෙ ගැන එච්චර උනන්දුවක් තිබ්බේ නෑ. ෆ්‍රෙඩී තාත්තත් එක්ක ගෙදර යනකොට කර ෆ්‍රෙඩී දැක්කා අයිවන්ට තනියම පාරේ යනවා ෆෝන් එක පාවිච්චි කර  ෆ්‍රෙඩි තාත්තාගෙන් ඇහුවා ඇයි තාත්තේ  අයිවන් තනියම පාරේ යන්නේ කියලා. ඒක ඇහිච්ච තාත්තා කිව්වා අපි එයාවත්  දාගෙන යමු කියලා ෆ්‍රෙඩී දන්නවා මේකට ගාව ගත්තොත් මට විසමක් වෙන්නේ නෑ කියලා තාත්තා කිව්වා කමක් නෑ දාගෙන යමු කියලා' දෙන්නම ගෙදර ගියා ගියාට පස්සේ විභාගයට පාඩම් කරන්න පටන් ගත්තා පාඩම් කරලා ඉවර වෙලා දෙන්නම නිදියන්න ගියා දෙන්නම නිදියා ගත්තේ ෆ්‍රෙඩී ගේ කාමරේ මේ ගෙදර කාමර විස්සක් විතර තියෙනවා.  හැබැයි මොකද අයිවන් මාගේ ඇදේම නිදියගන්නේ

තාත්තා කිව්වා ''කමක් නෑ අදට විතරයිනේ කියලා ''

තාත්තා ෆ්‍රෙඩිගේ හිත හැදුවා. ෆ්‍රෙඩි නිදාගත්තේ බිම මෙට්ටෙකුයි කොට්ටකුයි දාගෙන අයිවන් නිදාගත්තේ ෆ්‍රෙඩිගේ ඇඳේ. හැබැයි නිදියගත්තේ ෆෝන් එකේ Game කර කර, එකේ සද්දෙට ෆෙඩිට නින්ද ගියේම නෑ. උදේට නැගිට්ද්දි තාත්තා කිව්වා උදේ කෑම හරි කියලා දෙන්නම පාඩම් කරලා විභාගය හොඳට ලියලා ෆ්‍රෙඩි විතරයි පාස් වුණේ මේ හැමෝම මිනිස්සු සින්දු අහලා තමයි ජීවත් වුණේ, ඊට පස්සේ Concert එකට ගිහිල්ලා සතුටින් කාලය ගත කළා.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)



CS CamScanner